සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ඉන්දීය ඉතිහාසය - I

**12 ශ්‍රේණිය** | **කාලය පැය 01 යි.**

- **මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ප්‍රතිචාර 5 බැගින් දී තිබුණද නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එය තෝරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- **කොටස් දෙකටම මුළු කාලය පැය 3 කි.**

---

- **අංක 01 සිට 10 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.**

(01) (1) වින්ධ්‍යා (2) සත්පුර (3) හින්දුකුස් (4) බැරෝඩා (5) සුලෙයිමාන් (........)

(02) (1) ඉන්දුග්‍රීකයෝ (2) ශකවරු (3) කුෂාණයෝ (4) පාතියන්වරු (5) වාකාටක (........)

(03) (1) ඉන්ද්‍ර (2) වරුණ (3) මිත්‍ර (4) අග්නි (5) රාම (........)

(04) (1) භාරත වර්ෂ (2) සප්ත සින්දු (3) භාරත දේශ
(4) සප්ත සින්දු (5) ජම්බුද්වීප (........)

(05) (1) බෝලාන් (2) කරකෝරුම් (3) මක්‍රාත් (4) ඛයිබර් (5) බැරෝඩා (........)

(06) (1) ආර්. ඩී. බැනර්ජි (2) ජෝන් මාෂල් (3) ස්ටුවර්ට් පිගොට්
(4) මෝටිමර් වීලර් (5) ඇරිස්ටෝටල් (........)

(07) (1) ශිව (2) පශුපති (3) බ්‍රහ්ම (4) මහායෝගී (5) යෝගීෂ්වර (........)

(08) (1) මොහෙන්ජෝදාරෝ (2) හරප්පා (3) චන්හුදාරෝ
(4) කොට්ඩිජි (5) සුප්පාරක (........)

(09) (1) චතුර්වේද (2) බ්‍රාහ්මණ (3) පුරාණ (4) චතුර්වේද (5) ආරණ්‍යක (........)

(10) (1) ඍග් (2) යජුර් (3) කුර්රම් (4) අථර්වන් (5) සාම (........)

- **අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්නවල පද යුගල 5 බැගින් දී ඇත. ඒවා අතරින් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

(11) (1) පුර නගර (2) යාඥා පූජාව
(3) මුක්ත ගම්පති (4) විශ්පති ආරක්ෂක
(5) ජන රාජන් (........)

(12) (1) බිම්බිසාර හර්යංක (2) ධනනන්ද නන්ද
(3) කාලාශෝක ශිශුනාග (4) කුණාල මෞර්ය
(5) පුෂ්‍ය මිත්‍ර කාන්ව (........)

The National Learning Portal for The General Education

(13) (1) පරප්පා රවි (2) චම්පා සින්දු
(3) භාරුකච්ච නර්මදා (4) ඉන්ද්‍රප්‍රස්ථ යමුනා
(5) කාවේරිපට්ටන කාවේරි (........)

(14) (1) ඉන්ද්‍ර යුද්ධයට අධිපති (2) වරුණ සුළඟට අධිපති
(3) යම මරණයට අධිපති (4) කුවේර ධනයට අධිපති
(5) මරුත් කුණාටුවට අධිපති (........)

(15) (1) මිථිලා ලිච්ඡවි (2) සුංසුමාරගිරි භග්ගයෝ
(3) කුසිනාරා මල්ලයෝ (4) කපිලවස්තු ශාක්‍යයෝ
(5) කේසපුත්ත කාලාමයෝ (........)

- **අංක 16 සිට 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. X තීරුව Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.**

(16)

| X | Y |
|---|---|
| (i) චතුරාර්ය සත්‍ය | A දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග |
| (ii) චතුර්වේද | B සාම, දාන, භේද, දණ්ඩ |
| (iii) චතුර් ආශ්‍රම | C බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර |
| (iv) චතුර් වර්ණ | D ඍග්, යජුර්, සාම, අථර්වන් |
| (v) චතුර් උභය මාර්ග | E බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසි |

(1) ABCDE (2) AEBDC (3) ACDEB (4) ACBED (5) ADECB (........)

(17)

| X | Y |
|---|---|
| (i) ග්‍රාමණී | A ගම්පාලනය පිළිබඳ ප්‍රධානියා |
| (ii) ජන | B ගෝත්‍රික සභාවකි. |
| (iii) විෂය | C සාමූහික සංවිධානයකි. |
| (iv) පූග | D විෂය කිහිපයක් එක්වූ පාලන ඒකකයකි. |
| (v) සමිති | E ගම් සමූහයක් එක් වූ පාලන ඒකකයකි. |

(1) AEDCB (2) ABECD (3) ADECB (4) ACDBE (5) ADBCE (........)

(18)

| X | Y |
|---|---|
| (i) සිංදු ගංගාව | A හිමාලය |
| (ii) කෘෂ්ණා ගංගාව | B මාල්වා උස්බිම් |
| (iii) චම්බාල් ගංගාව | C ඩෙකැන් සානුව |
| (iv) බ්‍රහ්මපුත්‍ර ගංගාව | D බටහිර ඝාට්ස් |
| (v) මහානදී ගංගාව | E ටිබෙට් |

(1) ABDCE (2) AECDB (3) ADBEC (4) ACEBD (5) ADBCE (........)

(19) X | Y

| | X | | Y |
|---|---|---|---|
| (i) | මගධ | A | බිම්බිසාර |
| (ii) | අවන්ති | B | උදයන |
| (iii) | කෝසල | C | ප්‍රසෙනජිත් |
| (iv) | වත්ස | D | පුක්කුසාති |
| (v) | ගන්ධාර | E | ප්‍රද්‍යෝත |

(1) ACDBE (2) ABCDE (3) ACEBD (4) ADBCE (5) AEDBC (........)

(20)

| | X | | Y |
|---|---|---|---|
| (i) | බිම්බිසාර රජු | A | කෝසල දේවි |
| (ii) | කෝසල රජු | B | විදිසා දේවි |
| (iii) | අශෝක රජු | C | මල්ලිකා දේවි |
| (iv) | චන්ද්‍රගුප්ත රජු | D | රත්නා දේවි |
| (v) | ධර්මපාල රජු | E | ලිච්ඡවී කුමාර දේවි |

(1) ABDCE (2) AECBD (3) ABDEC (4) ACEDB (5) ACBED (........)

- **අංක 21 සිට 25 තෙක් වූ සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

(21) මොහෙන්ජෝදාරෝ නගරය පිහිටියේ කුමන ගංගාව අසලද ?

(1) යමුනා (2) සින්දු (3) නර්මදා
(4) තප්ති (5) මහානදී (........)

(22) වෛදික යුගයට අයත් වන ග්‍රන්ථය වන්නේ,

(1) යජුර් (2) පුරාණ (3) ඍග්
(4) සාම (5) අථර්වන් (........)

(23) බැරෝඩා කපොල්ල පිහිටියේ,

(1) හිමාලය කඳුවැටියේ (2) නිල්ගිරි කඳුවැටියේ (3) කැරකෝරම් කඳුවැටියේ
(4) වින්ධ්‍යා කඳුවැටියේ (5) නිල්ගිරි කඳුවැටියේ (........)

(24) මධ්‍ය ආසියාවේ ස්ටෙප්ස් තෘණ භූමි වල සිට ආර්යයෝ ඉන්දියාවට ඇතුළු වූයේ,

(1) මක්රාන් දුර්ගයෙනි (2) බැරෝඩා කපොල්ලෙනි. (3) ඛයිබර් දුර්ගයෙනි
(4) බෝලාන් දුර්ගයෙනි (5) ගුමාල් දුර්ගයෙනි (........)

(25) භූගෝලීය ලක්ෂණ මත දකුණු ඉන්දියාවේ සියලුම ගංගා ගලනු ලබන්නේ එක් දිශාවකට පමණි. එම දිශාව නම්,

(1) බටහිර සිට නැගෙනහිරට (2) උතුර සිට දකුණට (3) නැගෙනහිර සිට බටහිරට
(4) දකුණ සිට උතුරට (5) බටහිර සිට දකුණට (........)

- **අංක 26 සිට 30 තෙක් වූ සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

(26) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය බිඳවැටීම පිළිබඳව විවිධ මත,

(1) ජල ගැලීම් (2) සතුරු ආක්‍රමණය

(3) කැලෑ එළි පෙහෙළි කිරීම (4) දේශගුණික බලපෑම්

(5) ශිෂ්ටාචාර අතර ගැටුම් (........)

(27) වයඹ දිග ඉන්දියාව,

(1) ප්‍රධාන දුර්ග මාර්ග පිහිටීම (2) ප්‍රථමයෙන්ම ජනාවාස වීම

(3) පංජාබ් ප්‍රදේශය ශශ්‍රීක භූමිය වීම (4) වින්ධ්‍යා කඳු වැටිය පිහිටා තිබීම

(5) සින්දු ගංගාව ගලා බැසීම (........)

(28) ගංගා නිම්න තැනතලාව,

(1) පස සාරවත් නිසා ආර්ථිකය සාරවත් විය.

(2) මහා අධිරාජ්‍යය බිහිවිය

(3) ඛණිජ සම්පත් බහුල විය.

(4) මෙහි පළමුවෙන්ම රජ වූයේ අජාසත් රජුය.

(5) කලා, ගෘහ නිර්මාණ හා සාහිත්‍ය ද බිහිවිය. (........)

(29) පශ්චාත් වෛදික යුගය

(1) වර්ණ ක්‍රමය දැඩිවිය.

(2) අධ්‍යාපනය ලැබීමට හැකි වූයේ බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය හා වෛශ්‍යයන්ට පමණි.

(3) වේදය ඉගැන්වීමට අවසර තිබුනේ බ්‍රාහ්මණයින්ට හා වෛශ්‍යන්ට පමණි.

(4) ආශ්‍රම හතරකට බ්‍රාහ්මණයින්ගේ ජීවිතය බෙදා තිබුණි.

(5) කාන්තාවට අඩු ගෞරවයක් හිමි විය. (........)

(30) ඍග් වෛදික ජනයාගේ සමාජ තත්වය,

(1) ගෝත්‍රික අවධියක් විය.

(2) පීතෘ මූලික පවුලක් විය.

(3) සභා හා සමිති සංවිධාන ක්‍රමයක් විය.

(4) ගම පාලනය ගාමිණී විසින් සිදුවිය.

(5) පිළිගත් විවාහ ක්‍රමයක් නොවීය. (........)

- අංක 31 සිට 35 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **A, B, C** හා **D** යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා

**A** හා **B** පමණක් නිවැරදි නම් ............. (1) ද
**B** හා **C** පමණක් නිවැරදි නම් ............. (2) ද
**C** හා **D** පමණක් නිවැරදි නම් ............. (3) ද
**A** හා **C** පමණක් නිවැරදි නම් ............. (4) ද
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් පමණක් ............. (5) ද
වරහන් තුළ ලියන්න.

**උපදෙස් සම්පිණ්ඩනය**

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| **A** සහ **B** පමණක් නිවැරදි ය. | **B** සහ **C** පමණක් නිවැරදි ය. | **C** සහ **D** පමණක් නිවැරදි ය. | **A** සහ **C** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

(31) ඍග් වෛදික යුගය,

(A) වර්ණ ක්‍රමය දැඩිලෙස ක්‍රියාත්මක විය.

(B) යාඥා සඳහා කාන්තාවට අවසර නැත.

(C) වරුණ හා ඉන්ද්‍ර මෙකල ප්‍රධාන දෙවිවරුන්ය.

(D) බිලි පූජා, දෙවියන් අදහන එක් ක්‍රමයක් වේ. (........)

(32) සින්දු ගංගා නිම්න,

(A) මෙම පාලනය තුළ ජනාවාස පිහිටුවීමට හැකි වූයේ පසෙහි සාරවත් බව ද බලපාන්නට ඇත.

(B) ප්‍රදේශයේ සශ්‍රීකත්වය ද එයට බලපෑවේය.

(C) දුර්ග මාර්ග වල දුර්වලතාවය හේතුවෙන් ආක්‍රමණිකයන්ට ඒමට බාධාවක් නොවීය.

(D) සශ්‍රීකත්වය විසින් වැසියාට දාර්ශනික හා සංස්කෘතික ක්‍රියාකාරකම් කෙරෙහි යොමුවීමට ඉඩ සැලසීය. (........)

(33) බින්දුසාර රජු,

(A) අවුරුදු 25 ක් මගධය පාලනය කළ බව 'පුරාණ' ග්‍රන්ථවල දැක්වේ.

(B) අවන්තියේ කැරැල්ලක් ඇති වූ විට එය මැඩපවත්වන ලද්දේ අශෝක විසිනි.

(C) සිරියානු අධිරාජයා විසින් ඩයිමාකොස් බින්දුසාර රජුගේ රාජ සභාවට තානාපති ලෙස පත්කර එවන ලදී.

(D) තම පියාගෙන් උරුම වූ අධිරාජ්‍ය ආරක්ෂා කරගත නොහැකි විය. (........)

(34) ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ පැවැති සමූහාණ්ඩු,

(A) සමූහාණ්ඩු 16 කින් යුක්ත විය.

(B) සමූහාණ්ඩු සණ සහ සංඝ යනුවෙන් හැඳින්විනි.

(C) වජ්ජි සහ ලිච්ඡවි ඇතුළු ගෝත්‍ර අටක් වජ්ජි සමූහාණ්ඩුවට අයත් විය.

(D) සියළුම සමූහාණ්ඩු ගංගා නම් ගංගා මිටියාවතේ පිහිටියේය. (........)

(35) ඉන්දු ග්‍රීකයෝ,

(A) පැරණි ඉන්දීය සාහිත්‍යයේ ග්‍රීකයන් යවන නමින් හැඳින් වූහ.

(B) ඩිමෙට්‍රියන් සහ මිනැන්ඩර් වැදගත් ග්‍රීක රජුන් ය.

(C) මහා ඇලෙක්සැන්ඩර් රජු වයඹ දිග පාලනය කළ ඉන්දු ග්‍රීක පාලනය විනාශ කළේය.

(D) බටහිර ලෝකයට බුද්ධාගම හඳුන්වා දෙන ලද්දේ මොවුන් විසිනි. (........)

- **අංක 36 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| පළමු ප්‍රකාශය | | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදිය. | වැරදිය. |
| (2) | නිවැරදිය. | නිවැරදිය. |
| (3) | වැරදිය. | වැරදිය. |
| (4) | වැරදිය. | නිවැරදිය. |
| (5) | නිවැරදිය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| (36) | ඉන්දියාවට ආර්යයන් පැමිණියේ මධ්‍ය ආසියාවේ සිටය. | දුර්ග මාර්ග අතරින් ඛයිබර් දුර්ගය දුර්වල මාර්ගයක් විය. | (........) |
| (37) | ඉන්දියාව පැහැදිලිව භූගෝලීය වශයෙන් කොටස් තුනකට බෙදිය හැකිය. | මෙම වෙන් කිරීම තුළ ආර්යාවර්තය නමින් ද කොටසකි. | (........) |
| (38) | ඉන්දු නිම්න ශිෂ්ටාචාරය සිංදු ගංගාව ආශ්‍රිතව පිහිටියේය. | ශිෂ්ටාචාරය තුළ නගර නිර්මාණය, ආර්ථිකමය හා ආගමික වශයෙන් විශාල දියුණුවක් ද විය. | (........) |
| (39) | පංජාබ් ප්‍රදේශය ගංගා නිම්න තැනිතලාවේ සරුසාර ප්‍රදේශයකි. | ගංගා නිම්න තැනිතලාවේ මුල්ම අධිරාජ්‍ය අශෝක රජු ගොඩනගන ලදී. | (........) |
| (40) | නර්මදා නදිය දකුණු ඉන්දියාවේ පිහිටා ඇති ගංගාවකි. | භූගෝලීය වශයෙන් වින්ධ්‍යා කඳුවැටිය මගින් ඉන්දියාව කොටස් දෙකකට බෙදිය හැකිය. | (........) |

(ල. 01 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ඉන්දීය ඉතිහාසය - II

**12 ශ්‍රේණිය**

**කාලය පැය 02 යි.**

- **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න. (පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.)**

---

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් වූ සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමැති දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) ඛයිබර් (ii) හරප්පා (iii) නර්මදා නදිය

(iv) වින්ධ්‍යා කඳුවැටිය (v) සුප්පාරක (vi) ථාර් කාන්තාරය

(vii) බැරෝඩා කපොල්ල (viii) තාම්‍රලිප්ති

02. පැරණි ඉන්දීය ඉතිහාසය හැඩ ගැස්වීමෙහි ලා භූගෝලීය ලක්ෂණ බලපෑවේය. එවැනි ලක්ෂණ දෙකක් පිළිබඳව සාකච්ඡා කරන්න.


03. ඉන්දියාවේ පංජාබ් ප්‍රදේශය නැතහොත් වයඹදිග ඉන්දියාව ජනාවාස වූ අයුරු පිළිබඳ විස්තරයක් කරන්න.

04. ඉන්දු නිම්න වැසියන්ගේ නාගරික ජීවිතය විදහාපාන ලක්ෂණ එම ශිෂ්ටාචාරයේ ඇති නටබුන් වලින් පැහැදිලි වේ. නාගරීකරණය පැවති බවට උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න.

05. ඍග් වෛදික යුගයේ සමාජ තත්වය පැහැදිලි කරන්න.

- අංක 01 ප්‍රශ්නය සඳහා අදාළ සිතියම.

## ඉන්දියා සිතියම




e තක්සලාව National e-learning Portal for The General Education